# බෞද්ධ භාවනාව ප්‍රගුණ කිරීමෙහි ලා සක්මන් මළුවේ උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්.

පූජ්‍ය ගල්වැවේ විමලඛන්ති හිමි[1], පූජ්‍ය උල්පතගම අමිතරතන හිමි[2]

## හැඳින්වීම

බෞද්ධ භාවනාව ප්‍රගුණ කිරීම සඳහා සක්මන් මළුවේ උපයෝගීතාව පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් විමර්ශනයක් සිදු කිරීම මෙහි දී සිදු කරනු ලැබේ.

## පර්යේෂණ අරමුණ

සක්මන් භාවනාව හා ඒ සම්බන්ධ ත්‍රිපිටකාගත තොරතුරු අනුරාධපුර යුගයේ ආරාම තුළින් තහවුරු වන්නේ දැයි විමර්ශනය කිරීම

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රය මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන් උපයෝගී කොටගෙන සිදු කරනු ලැබේ.

## පර්යේෂණ සාකච්ඡාව

ලෝකයේ ජීවත් වන බෞද්ධාගමික සියලු දෙනාගේ ඒකායන අරමුණ යම් දවසක මානවසන්තානයන් තුළ පවතින ක්ලේශධර්මයන් ප්‍රහීණ කොට නිර්වාණාවබෝධයට  පත් වීම ය. බෞද්ධ දර්ශනයට අනුව මිනිසා තුළ පවත්නා නො නිමි අපේක්ෂාවන් සියල්ල අවසන් වූ තැන නිවීමට පත් වේ. විශේෂයෙන් මිනිසා ගතවන හැම තප්පරයක ම වික්ෂිප්ත මනසකින් ක්‍රියා කරනු ලබන බව බුදුරජාණන් වහන්සේ **"දූරඞ්ගමං එකචරං", "නගරූපමං චිත්තමිදං ඨපෙත්‍වා"** යන ධම්මපද ගාථාවලින් පෙන්වා දී තිබේ. ඒ අනුව විවිධ අරමුණු කරා ගමන් කරන මනස එක තැනකට එකතු කරනු ලබන්නේ භාවනාව තුළිනි. වෙනත් ආගමික සම්ප්‍රදායක නොමැති බෞද්ධාගමික සම්ප්‍රදායටම ආවේණික වූ භාවනා ක්‍රමවේද කිහිපයක් දක්නට ලැබේ. එම භාවනා ක්‍රමවේද මූලික වශයෙන් ක්‍රම දෙකකට අනුගමනය කරනු ලබයි. සමථ සහ විදර්ශනා යනුවෙනි. බෞද්ධ දර්ශනයට අනුව සමථ භාවනාව යනු භාවනාව ප්‍රගුණ කිරීමෙහි ලා පළමු අවස්ථාව යි. මෙම සමථය ප්‍රගුණ කිරීමෙන් නිර්වාණාබෝධයට පත් විය නො හැකි අතර, පංචනීවරණධර්ම යටපත් කළ හැකි අතර, එහි උපරිම ඵලය ලෙස පංච අභිඥා සහ අෂ්ටසමාපත්ති ලබාගත හැකි ය. විදර්ශනාවෙන් නිර්වාණාවබෝධයට අවශ්‍ය කරනු ලබන ක්‍රියාකාරකම් සාක්ෂාත් කරගත හැකි ය. මෙම ක්‍රමවේද දෙකට අමතරව අනුගමනය කරන තවත් භාවනා ක්‍රමවේදයක් වන්නේ සක්මන් භාවනාව ය. සක්මන් භාවනාව තුළින් ද මනස දියුණු කළ හැකි බව බුදුරජාණන් වහන්සේ කරුණු දක්වා තිබේ. ආරාමයක් තුළ සක්මන් මළුවක් සකස් කරගත යුතු ආකාරය පිළිබඳ කරුණු රාශියක් චුල්ලවග්ගපාළියේ දක්වා තිබේ. සක්මන් මළු භාවිතයේ ඉතිහාසය ද බුදුරජාණන් වහන්සේගේ ධරමාන

[1]. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, *bomaluwatemple@gmail.com*
[2]. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, *uamitha@gmail.com*

යුගය දක්වා ම දිවෙන බව ත්‍රිපිටක සාහිත්‍යාගත තොරතුරු මගින් අනාවරණය වේ. විශාලා මහනුවර වාසය කළ භික්ෂූන් වහන්සේලා ප්‍රණීත ආහාර වැළඳීමත් ශරීරයට ව්‍යායාමයක් නොතිබූ හෙයිනුත් වත් පිළිවෙත් පමණක් සිදු කිරීම ප්‍රමාණවත් නො වූ හෙයිනුත් ජීවක වෛද්‍යවරයා බුදුරජාණන් වහන්සේට සැල කර සිටියේ ජන්තාඝරය සමඟ සක්මන් මළුව ද භික්ෂූන් වහන්සේලා සඳහා නිර්දේශ කරන ලෙස යි.

**"කූටාගාරෙ ච පාසාදෙ - මණ්ඩපෙ හම්මියෙ ගුහා**

**චඞ්කමෙ සුකතෙ කත්‍වා - සඞ්ඝාරාමං අමාපයිං"**

කුළුගෙවල් ද ප්‍රාසාදයන් ද මණ්ඩපයන් ද සඳළු සහිත ගෙවල් ද දොර නොලූ ගුහාවන් ද සක්මන් මළු ද මැනවින් කොට සඞ්ඝාරාම නිමවීම යි, (අ.පා, 2005 : 68-69). ත්‍රිපිටක අර්ථකෝෂයෙහි 'චඞ්කමති' යන පාලි වචනය සඳහා අර්ථවිවරණය සපයා ඇත්තේ 'සක්මන් කරයි' යන අර්ථය යි, (ත්‍රි.අ.කෝ, 2550 : 107). ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂයෙහි 'සක්මන්' යන වචනය සඳහා අර්ථ කිහිපයක් ලබා දී තිබේ. චඞ්ක්‍රමණය - ඔබ මොබ යෑම, සක්මන් කරන තැන - ගේ - මණ්ඩප - මඩු සක්මන් කරන තැන සෑදූ ශාලාව - මළු සක්මන් කිරිම සඳහා සෑදූ මළුව - හල් සක්මන් ගෙය, (සෝරත හිමි, 1999 : 1011). බෞද්ධ ශබ්දකෝෂ II කොටසෙහි 'සක්මන' යන වචනය සඳහා සකමන (පා. චඞ්කමන) වෙනස් නො වුණු සිත; නො පෙරළුණු සිත යනුවෙන් අර්ථකථන ලබා දී තිබේ, (ලියනගේ, 2010 : 1508). දෙවන අදහස නම්, සක්මන යනු 'වෙනස්  නො වුණු සිත' යන අර්ථයෙන් දක්වා තිබේ. එයින් පැහැදිලි වන්නේ සක්මන් කිරීම තුළින් කය පිරිසිදු වන්නාක් මෙන් ම, මනස ද පාරිශුද්ධත්‍වයට නො හොත් නිවීමට පත්වන බව ය. ඒ අනුව මෙම අර්ථ දෙකට ම සක්මන් මළුව යොදා ගන්නට ඇති බව සිතිය හැකි ය. විනයපිටකයේ චුල්ලවග්ගපාළියේ ඛුද්දකවත්ථුක්ඛන්ධකයට අනුව අනෙකුත් ගොඩනැගිලි මෙන් ම සක්මන් මළුව ද එකවර නිර්මාණය වූවක් නො වන බව දක්නට ලැබේ. සක්මන් මළුවක් සැකසීමේ දී දිග ප්‍රමාණය වැඩියෙනුත් පළල ප්‍රමාණය අඩුවෙනුත් යොදා ඇත. ජීවක වෛද්‍යවරයාගේ මෙම අදහසට අනුව බුදුරජාණන් වහන්සේ විසින් පනවා වදාළ මෙම සක්මන් මළුවේ උපයෝගීතාවන් දෙකක් සිදු කොට තිබෙන බව දැකගත හැකි ය. ඒ අනුව සැහැල්ලු ශරීරයක් ලබා ගැනීම සහ සැහැල්ලු මනසක් ලබා ගැනීම යන කාර්යයන් දෙක ම මෙම ස්ථානය තුළින් ඉටු කර ගෙන ඇති බව දක්නට ලැබේ.

**"චඞ්කමනං ජන්තාඝරං - විසමෙ නිච්චවත්ථුකා**

**තයො ච යෙ විඤ්ඤත්ති - සොපාණාලම්බවෙදිකං"**

සක්මන් මළුව ද, ගිනිහල් ගෙය ද අනුදත්හ. මෙම සක්මන් මළුව ද ඒ ඒ අවශ්‍යතාව වෙනුවෙන් සංවර්ධනයට පත් වූවක් බව චුල්ලවග්ගපාළියේ ඛුද්දකවත්ථුක්ඛන්ධකයේ එන තොරතුරු මගින් අනාවරණය වේ. බුදුරජාණන් වහන්සේගේ කාලයේ භික්ෂූන් වහන්සේලා විෂම සක්මන් මළුවෙහි සක්මන් කරත්. පාදයන් පීඩාවට ලක් වේ. මේ බව දැනගත් බුදුරජාණන් වහන්සේ විෂම වූ සක්මන් මළුව සම කරන්නට අනුදැන වදරන ලදී, (චු.පා, 2005 : 118-119). මෙහි සඳහන් තොරතුරුවලට අනුව මුලින් ම මිටි බිමෙක සකසා ඇති හෙයින් පොළොවේ විෂමතා ඇති හෙයින් වෙනස් කොට බැමි තුනකින් යුක්ත

එකක් සැකසීම සඳහා අනුදැන වදාරන ලදී. එයට නැඟීමට යෑමේ දී වෙහෙස වන හෙයින් පඩිපෙළ ද අත්වැට ද සක්මන් මළුව සඳහා අනුදැන වදාරා තිබේ. ඊටත් පසුකාලීන ව සක්මන් කරන භික්ෂූන්ට වෙනත් අභියෝගවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් නැවතත් සක්මන් මළුව සඳහා නව අඞ්ග එකතු කොට තිබේ. මහණහු එළිමහන සක්මන් කරන සක්මන් හලට තණරොඩු වැටෙයි. පියස්ස ඇතුළතින් පිටතින් බදාම ආලේප කිරීම අනුදත්හ. එය සුදුපැහැ කළුපැහැ ද කරන්නට ද ගුරු පිළියම් කරන්නට ද අනුදත්හ. භික්ෂූන් වහන්සේලා එළිමහනෙහි සක්මන් කරන අතර, එහි දී වන අපහසුතා තණරොඩු වැටීම, හේතුවෙන් පියස්සක් තැනීමටත් ඒ සඳහා බදාම යෙදීම හා එම බැම්ම වර්ණවත් කිරීම සඳහා ආලේපන වර්ග ආදිය ද සුදුසු බව පෙන්වා දී තිබේ.

මේ අනුව භාරතයේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටි සමයේ බොහෝ ආරාමවල මෙම සක්මන් මළු නිර්මාණය වී තිබෙන්නට ඇත. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි සමයෙහි උන්වහන්සේ විසින් භාවිත කරන ලද සක්මන් මළුව වර්තමානයේ ඉන්දියානු රජය මඟින් සංරක්ෂණය කොට පවත්වාගෙන යනු ලබයි.

බුදුදහම මෙරටට සඞ්ක්‍රමණය වීමේ දී එහි ආභාසය ලැබූ අනෙකුත් ගොඩනැඟිලි අඞ්ග අතර සක්මන් මළුව ද මෙහි ස්ථාපනය වූ බවක් දක්නට ලැබේ. විශේෂයෙන් මෙරට ආරාම සම්ප්‍රදායෙහි විස්තර සපයන සිවුර සහ නඟුල යන ග්‍රන්ථයෙහි අභයගිරියෙහි සක්මන් මළුවලින් වට වූ පඤ්චායතන ගණයේ ගොඩනැඟිලි සමූහයක් තිබූ බව සඳහන් කරයි, (ගුණවර්ධන, 1979 : 298).

මහාවිහාරය, අභයගිරිය, ජේතවනය, රිටිගල, මානකන්ද, වෙහෙරබැඳිගල, හත්තිකුච්ඡි, මිහින්තලේ, විජයාරාමය, නාගොල්ල, පුලියන්කුලම, අරන්කැලේ යන ආරාමයන්හි භික්ෂූන් වහන්සේලාට සක්මන් භාවනාව සිදු කිරීම සඳහා සක්මන් මළු විශාල ප්‍රමාණයක් සකස් කර ඇති බව දැකගත හැකි වේ.

**පර්යේෂණ සමාලෝචනය**

බෞද්ධ භාවනාව ප්‍රගුණ කිරීමෙහි ලා නිර්වාණාබෝධයට ගමන් කිරීමට සක්මන් මළුවේ උපයෝගීතාව බෙහෙවින් වැදගත් බව ඉහත සඳහන් තොරතුරු මඟින් අනාවරණය වේ. විශේෂයෙන් අනුරාධපුර යුගයේ පටන් ආරාම ආශ්‍රිතව සක්මන් මළුව භාවිතයට ගත් බව දක්නට ලැබේ.

**ප්‍රමුඛ පදඃ** සක්මන, හල් සක්මන්, සමථ, විදර්ශනා, මළුව

මූලාශ්‍රය


- **චුල්ලවග්ගපාළි.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- ගුණවර්ධන, රණවීර (1993). **සිවුර සහ නඟුල.** කොළඹඃ සීමා සහිත කරුණාරත්න සහ පුත්‍රයෝ.
- **ත්‍රිපිටක අර්ථකෝෂය.** (2550). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නුගේගොඩඃ අජිත් ප්‍රින්ටර්ස්.
- සෝරත හිමි, වැලිවිටියේ (1999). **සිංහලාර්ථ සහිත සංස්කෘත ශබ්දාර්ණවය.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.